**10-11-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ සිරුර, මනස සහ ධනයෙන්, එනම්, ඔබගේ සිතිවිලි, වචන සහ ක්‍රියා වලින් උපත් 21 කට එහි ප්‍රතිලාභය පරම පියාගෙන් ආපසු ලැබෙන ආකාරයේ එවැනි සේවයක් සිදු කරන්න. කෙසේවෙතත්, සේවය කරන අතරතුර එකිනෙකා සමග අසමගිකම් ඇතිකර නොගන්න.

**ප්‍රශ්නය:** නාටකයට අනුව, පරම පියා ඔබට කිරීමට දිරිගන්වන සේවයට, වේගවත් බවක් යොදන්නේ කෙසේද?

**පිළිතුර:** එකමුතුකම තිබිය යුතු අතර, එකිනෙකා අතරේ ගැටුම් නොතිබිය යුතුයි. යම් ගැටුමක් තිබෙන්නේ නම්, ඔබ කරන්නේ කුමන සේවයක්ද? මේ නිසයි, ඔබ සියලු දෙනාම එකට මුණගැසී, ඔබ අතරේ සෑම දෙයක්ම සාකච්ඡා කර, එකිනෙකාට උදව් කළ යුත්තේ. බාබා කොහොමත් උදව්කරුවාය, නමුත් ‘නිර්භීතකම පවත්වා ගන්නා දරුවන්ට පියාගේ උපකාර ලැබෙයි’ හි නිවැරදි අරුත ඔබ වටහා ගෙන, මෙම විශාල කාර්යයේ උදව්කරුවන් විය යුතුයි.

ඕම් ශාන්ති. ඔය සුමිහිරිතම දරුවන්, ආධ්‍යාත්මික පියා වෙතට මෙහි පැමිණෙන්නේ නැවුම් වීම සඳහාය. නැවුම් වීමෙන් පසු, ඔබ ආපසු ගිය විට, අනිවාර්යෙන්ම යමක් කළ යුතුයි. සෑම දරුවෙක්ම සේවය ඔප්පු කර පෙන්විය යුතුයි. නිදසුනක් ලෙස, සමහර දරුවන් පවසන්නේ, ඔවුන්ට මධ්‍යස්ථානයක් විවෘත කිරීමට අවශ්‍ය බවයි. ගම් වලද සේවය සිදු කරයි. ඔබගේ අනාගත උපත් 21 ක් වෙනුවෙන් එහි ප්‍රතිලාභය පරම පියාගෙන් ආපසු ලබා ගැනීමට හැකි අන්දමේ එවන් සේවයක්, ඔබගේ සිතිවිලි, වචන, ක්‍රියා, සිරුර, මනස සහ ධනයෙන් කිරීමට, ඔය දරුවන් සෑම විටෙකම සිතමින් සිටිය යුතුයි. ඔබට මෙම සැලකිල්ල තිබිය යුතුයි මා යමක් කරනවාද? මම කිසියම් දැනුමක් අන් අයට ලබා දෙනවාද? දවස පුරාම ඔබට මෙවන් සිතිවිලි ඇති විය යුතුයි. ඔබට මධ්‍යස්ථානයක් විවෘත කළ හැක, නමුත් නිවසේ සැමියා සහ භාර්යාව අතර කිසිම මතභේදයක් නොතිබිය යුතුයි කිසි අවුලක් නොතිබිය යුතුයි. සන්‍යාසීන් නිවසේ අවුල් වලින් පැන යයි ඔවුන්ට කිසි සැලකිලිමත් බවක් නොමැති අතර, නිකම්ම පිටමං වෙයි. රජය ඔවුන්ව නැවැත්වීමට උත්සාහ දරනවාද? මෙසේ පිටමං වන්නේ පිරිමින් පමණයි. මෙකල, කිසි කෙනෙක් නොමැති හෝ නිරාශාව ඇති ස්ත්‍රීන්ද මතු වී ඇති අතර, සන්‍යාසීන් ඔවුන්ටද උගන්වයි. ඔවුන්ගේ (සන්‍යාසීන්) ව්‍යාපාර මේ අය මගින් කරගෙන යයි. ඔවුන් (සන්‍යාසීන්) මුදල් සියල්ලම තබා ගනී. ඇත්ත වශයෙන්ම ඔවුන් තම නිවෙස් හැර ගිය පසු, ඔවුන්ට කිසිම මුදලක් තබා ගැනීමට අවශ්‍ය නැහැ. එබැවින් පරම පියා දැන් ඔය දරුවන්ට විස්තර කරයි. පරම පියාගේ හැඳින්වීම ලබා දිය යුතු බව, ඔබ සෑම දරුවෙකුගේම බුද්ධියට ඇතුලු විය යුතුයි. මනුෂ්‍යයන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත ඔවුන් අනුවණයි. ඔය දරුවන් වෙනුවෙන් පරමාත්ම පියාගේ අණසක වන්නේ සුමිහිරිතම දරුවනි, තමන් ජීවාත්මයක් බව සලකන්න නිකම්ම පණ්ඩිතයෙක් නොවන්න. තමන්ටද යහපතක් කරගන්න සිහිපත් කිරීම තුළින් සතෝප්‍රධාන් වන්න. ඔබ බොහෝ උත්සාහ දැරිය යුතුයි. එසේ නැත්නම් ඔබට බොහෝ පසුතැවිලි වන්නට සිදුවෙයි. ඇතමුන් පවසන්නේ බාබා, මට ඔබව නැවත නැවතත් අමතක වනවා. මට වෙනත් බොහෝ සිතිවිලි ඇති වනවා. බාබා පවසන්නේ ඒවා පැමිණෙයි. ඔබ පරම පියාගේ සිහි කිරීමේ සිට, සතෝප්‍රධාන් විය යුතුයි. අපවිත්‍ර වී ඇති ජීවාත්ම, පරමාත්ම පියා, පරමාත්ම ජීවය, සිහිපත් කිරීමෙන් පිවිතුරු විය යුතුයි. පරම පියා දරුවන්ට උපදෙස් ලබා දෙයි අහෝ කීකරු දරුවනි, ඔබගේ පාපයන් කපා ගැනීම සඳහා, මා සිහිපත් කිරීමට, මම ඔබට උපදෙස් දෙන්නෙමි වෙනත් ක්‍රමයක් නොමැති අතර වෙනත් කිසිවෙකුට ඔබට වෙන ක්‍රමයක් පෙන්වා දීමටද නොහැක. බොහෝ සන්‍යාසීන් සිටිනවා ඔවුන් ඔබට යෝගා සම්මන්ත්‍රණ වලට සහභාගී වන ලෙස ආරාධනා කරයි. ඔවුන්ගේ හත යෝගාවෙන් කිසිම කෙනෙකුට ප්‍රයෝජනයක් නොවන බව ඔබ දන්නවා. රාජයෝගාව ගැන ඔවුන් නොදන්නා, බොහෝ යෝගා ආශ්‍රම තිබේ ඔවුන් පියාවවත් නොදනී. අසීමිත පියා පැමිණ, ඔබට සත්‍ය යෝගාව උගන්වයි. පරම පියා ඔබව ඔහු හා සමාන බවට පත් කරවයි. මා අශාරීරික වන අතර, මම මෙම සිරුර ගන්නේ තාවකාලකවයි. ‘භාග්‍ය රථය’ අනිවාර්යෙන්ම මනුෂ්‍යයකුගේය ගවයෙකුට එසේ නොකියයි. එය අශ්වයෙක් හෝ රථයක් ගැන ප්‍රශ්නයක් නොවෙයි. කිසිම සටනක් පිළිබඳ ප්‍රශ්නයක්ද නැත. ඔබ සටන් කළ යුත්තේ මායා සමග පමණක් බව ඔබ දන්නවා. මෙසේ සිහි කර තිබේ මායා පරාජය කරන අය, ලෝකයම ජයගනී. ඔබට ඉතා හොඳින් විස්තර කළ හැකි නමුත් ඔබ තවමත් ඉගෙනගන්නවා. ඉගෙන ගන්නා අතර, ඇතැම් අය සම්පූර්ණයෙන්ම වැටෙයි. බොහෝ ගැටුම් තිබෙයි.

ඇතැම් විට සහෝදරියන් දෙදෙනෙක් අතර පවා එකමුතුකමක් නොමැති වෙයි ඔවුන් ලුණු වතුර මෙන් වෙයි. ඔබ අතරේ කිසිම ගැටුමක් නොතිබිය යුතුයි. ගැටුමක් තිබෙන්නේ නම්, පියා මෙසේ කියයි ඔබ කරන්නේ කුමන සේවයක්ද? බොහෝ හොඳ දරුවන්ගේ තත්ත්වය මෙයයි. මාලාව, දැන් නිර්මාණය කරන්නේ නම්, එය පලුදු වුණු මාලාවක් වෙයි. දරුවන් තුළ තවමත් යම් යම් දුර්වලතා ඇත. නාටකයේ සැලසුමට අනුව, බාබා ඔබව සේවය කිරීමට දිරිමත් කරයි ඔහු අඛණ්ඩව උපදෙස් ලබා දෙයි. ගොස් දිල්ලිය වට කරන්න. මෙය කළ යුත්තේ එක්කෙනෙක් පමණක් නොවෙයි. ඔබලා අතරේ මෙය සාකච්ඡා කරන්න. ඔබ සැම කෙනෙක්ම එකඟ විය යුතුයි. බාබා තනිව සිටින නමුත් ඔහුගේ උදව්කරුවන් වන ඔහුගේ දරුවන් නොමැතිව, ඔහු මෙම කාර්යය සිදු කරන්නේ නැත. ඔබ මධ්‍යස්ථාන විවෘත කර මිනිසුන්ගේ අදහස් ගනී. බාබා විමසන්නේ ඔබ උදව්කරුවන්ද? ඔබ පිළිතුරු දෙන්නේ ඔව්, බාබා. උදව්කරුවන් නොසිටියේ නම්, කිසි දෙයක් කිරීමට නොහැකි වෙයි. ඔබගේ නිවසට නෑදෑ මිතුරන් එයි. ඔවුන් ඔබට අපහාස කළත් විහිලු කළත්, ඔබ ඒ ගැන සැලකිලිමත් නොවිය යුතුයි. ඔය දරුවන් අසුන්ගෙන, ඔබ අතර, සාකච්ඡා පැවැත්විය යුතුයි. මධ්‍යස්ථානයක් විවෘත කළ විට, ඔවුන් සියල්ලම එකට අසුන්ගෙන බාබාට මෙසේ ලියයි බාබා, අපි මේ සියලු දේ කරන්නේ ගුරුවරයාගේ අවවාද ඇතුවයි. සින්දි භාෂාවේ ඔවුන් පවසන්නේ ‘1 සහ 2 එකට දමන්න, එවිට එය 12 වෙයි.’ 12 දෙනෙක් එකතු වන්නේ නම්, ඉතා හොඳ ඔවදන් ඉස්මතු වෙයි. සමහර ස්ථාන වල, ඔවුන් එකිනෙකාගෙන් ඔවදන් ලබා ගන්නේවත් නැත. ඒ අන්දමින් කිසි දෙයක් කිරීමට හැකි වෙයිද? බාබා මෙසේ පවසයි ඔබගේ හමුව තුළ එකමුතුකම ඇති වන තුරු, ඔබ මෙතරම් විශාල කාර්යයක් සිදු කරන්නේ කෙසේද? කුඩා සාප්පු මෙන්ම විශාල සාප්පු තිබේ. ඔවුන් සියලු දෙනාම එකට එකතු වෙයි. කිසි කෙනෙක් මෙසේ නොකියයි බාබා, ඔබ අපට උදව් කරන්න! පළමුවෙන්ම ඔබ ඔබගේ උදව්කරුවන් නිර්මාණය කරගත යුතුයි. ඉන්පසුව බාබා පවසන්නේ දරුවන් නිර්භීතකම පවත්වාගන්නා විට, පියා උපකාර කරනවා. පළමුවෙන්ම ඔබගේ උදව්කරුවන් පිළියෙල කරගන්න. බාබා අපි මෙතරම් කරන අතර, ඉතිරි දේට ඔබ උදව් කළ යුතුයි. ඔබ මුලින්ම බාබාගෙන් උදව් ඉල්ලිය නොයුතුයි. පළමුව එඩිතරකම පවත්වාගන්න, එවිට... මෙහි අරුත ඔවුන්ට වැටහෙන්නේ නැත. පළමුව, ඔය දරුවන් තුළ එඩිතරකම තිබිය යුතුයි. කුමන දරුවන්ද උදව් කරන්නේ, එමෙන්ම කුමන ස්වරූපයෙන්ද? මුලු වාර්තාවම ලියන්න මේ කෙනා මෙම උපකාරය කරනවා. සැම දෙයක්ම ලිඛිතව නිල වශයෙන් දිය යුතුයි. එක් එක් කෙනා මෙසේ කියන්නේ නැත මම මධ්‍යස්ථානයක් විවෘත කරනවා, එබැවින් මට උදව් කරන්න! එසේ නම් බාබාට ඒවා විවෘත කිරීමට නොහැකිද? කෙසේවෙතත්, එය කළ නොහැක. කොමිටියක් එකට හමු විය යුතුයි. ඔබ අතරද එය අංකානුරූපයි සමහරුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ඇතැම් අය බොහෝ සතුටින් සිටියි. ඔබ මෙම දැනුමෙහි බොහෝ සතුටින් සිටිය යුතු බව, බාබාට හැඟෙයි. ඔබට දැන් පියා, ගුරුවරයා සහ ගුරුව, එක්කෙනෙක් තුළින් හමු වීම ගැන, ඔබට විශාල සතුටක් තිබිය යුතුයි. ලෝකයේ කිසිම කෙනෙක් මෙම දේවල් ගැන නොදනී. ඥානයේ මහා සයුර, පාරිශුද්ධකරු සහ සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා වන්නේ, ශිව බාබාම පමණයි. සියල්ලන්ගේම පියා එක්කෙනෙකි. වෙනත් කිසිවෙකුගේ බුද්ධියේ මෙය නොමැත. ඔහු ඥානයෙන් පිරුණු කෙනා, විමුක්තිය පිරිනමන්නා මෙන්ම මාර්ගය පෙන්වන්නාද වන බව, ඔය දරුවන් දැන් දන්නවා. එබැවින් ඔබ පරම පියාගේ උපදෙස් පිළිපැදිය යුතුයි. එකට එකතු වී, ඔබලා අතරේ සාකච්ඡාවක් පවත්වන්න. ඔබට මුදල් වැය කිරීමට තිබෙන විට, ඔබට එක් පුද්ගලයෙකුගේ උපදෙස් පමණක් පිළිපැදිය නොහැක. සැම කෙනෙක්ම උදව් කළ යුතුයි. ඔබට එපමණින් නුවණ තිබිය යුතුයි. ඔය දරුවන් මෙම පණිවිඩය සැම නිවසකටම ලබා දිය යුතුයි. ඇතැම් අය විමසන්නේ අපට විවාහ උත්සවයකට ආරාධනාවක් ලැබී තිබේ, අප එහි යා යුතුද? බාබා පවසන්නේ ඇයි නැත්තේ? ගොස් සේවය කරන්න. බොහෝ දෙනෙකුට යහපතක් සිදු කරන්න. ඔබට දේශනයක්ද කළ හැක ‘මරණය අත ළඟයි. පරම පියා පවසන්නේ නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න.’ මෙහි සැම කෙනෙක්ම පාපාකාරී ජීවයන්ය. ඔවුන් දිගින් දිගටම පරම පියාට අපහාස කරයි. ඔවුන් ඔබව පරම පියාගෙන් ඉවතට හරවයි. විනාශ කාලයේදී, සෙනෙහස නොමැති, විරසක වූ බුද්ධි ඇති අය සිටින බව, සිහි කර තිබේ. මෙය පැවසුවේ කවුද? පරම පියාම පවසන්නේ ඔවුන්ගේ බුද්ධියේ මා කෙරෙහි සෙනෙහසක් නැත විනාශ කාලයේදී ඔවුන්ගේ බුද්ධිය තුළ සෙනෙහසක් නැත. ඔවුන් මාව, කොහොමත් හඳුනන්නේ නැත. සෙනෙහසින් පිරි බුද්ධි ඇති අය සහ මා සිහි කරන අය පමණයි, ජය ලබන්නේ. ඔවුන්ට සෙනෙහස තිබෙන නමුත් මා සිහි නොකරන්නේ නම්, අඩු තත්ත්වයක් ලබයි. පරම පියා දරුවන්ට උපදෙස් ලබා දෙයි. ප්‍රධානතම දෙය වන්නේ සැම කෙනෙකුටම පණිවිඩය දීමයි. පරම පියා සිහිපත් කරන්න, එවිට ඔබ පාරිශුද්ධත්වයට පත් වී, පිවිතුරු ලෝකයේ අධිපතියෙක් වෙයි. නාටකයට අනුව, බාබාට මහලු ශරීරයක් ණයට ගැනීමට තිබේ. ඔහු මෙම කෙනාගේ විශ්‍රාමික වයසේදී ඔහු තුළට ඇතුලු වෙයි. මිනිසුන් දෙවියන්

සෙවීමට උත්සාහ දරන්නේ ඔවුන්ගේ විශ්‍රාමික වයසේදී පමණයි. භක්ති මාර්ගයේදී ඔවුන් විශ්වාස කරන්නේ, දෙවියන් හමුවීමට ඔවුන්ට මාර්ගය සෙවිය හැක්කේ, ජප කිරීම සහ තපස් රැකීම ආදියෙන් කියාය. ඔවුන්ට කවදා ඔහු හමු වෙයිද කියා ඔවුන් නොදනී. ඔවුන් උපතින් උපතට භක්තියේ යෙදී තිබේ. කිසි කෙනෙකුට පරමාත්ම දෙවියන් හමු වී නැත. පැරණි ලෝකය නැවතත් අලුත් කිරීමට තිබෙන විට, බාබා පැමිණෙන බව, ඔවුන්ට වැටහෙන්නේ නැත. නිර්මාණකරු වන්නේ පරම පියා පමණයි. පිංතූරය තිබෙන නමුත්, ත්‍රිමූර්ති පිංතූරයේ ඔවුන් ශිවාව පෙන්වන්නේ නැත. ශිව බාබා නොමැතිව, ඔවුන් බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ව පෙන්වා ඇත මෙය හරියට හිස කපා දමා ඇති සේය. පරම පියා නොමැතිව, ඔවුන් අනාථයන් බවට පත් වෙලා. පරම පියා පවසන්නේ මා පැමිණ, ඔබව ස්වාමියා සහ අධිපතියාට අයත් වීමට සලස්වයි. ඔබ උපත් 21 කට ස්වාමියා සහ අධිපති සතු වෙයි. ඔබට කිසිම අපහසුතාවයක් නොමැති වෙයි. තවද ඔබ මෙසේ පවසයි පරම පියාව හමු වන තුරු, අපි අනාථයන්ව සිටි අතර අපට තිබුණේ පහත් බුද්ධිය. ඔවුන් පාරිශුද්ධකරු ගැන කතා කරන නමුත් ඔහු පැමිණෙන්නේ කවදාද කියා ඔවුන් නොදනී. පිවිතුරු ලෝකය, නව ලෝකයයි. පරම පියා සෑම දෙයක්ම ඉතා සරළව විස්තර කර දෙයි. ඔබ දැන් පියාට අයත් බැවින්, ඔබ අනිවාර්යෙන්ම දෙව්ලොව අධිපතියන් වන බව, ඔබට දැන් වැටහෙයි. ශිව බාබා අසීමිත බවේ අධිපතිය. පැමිණ, සාමයේ සහ සතුටේ උරුමය ඔබට ලබා දුන්නේ පරම පියාය. ස්වර්ණමය යුගයේ සතුට තිබුණු අතර ඉතිරි සියලු ජීවාත්ම සිටියේ සාම දේශයේය. ඔබට දැන් මේ සියලුම දේ වැටහෙයි. ශිව බාබා පැමිණියේ කුමක් සඳහාද? ඔහු නිසැකයෙන්ම පැමිණෙන්නට ඇත්තේ ලෝකය අලුත් කිරීමට සහ අපවිත්‍ර අයව පිවිතුරු කිරීමටයි. ඔහු ශ්‍රේෂ්ඨ කාර්යයක් ඉටු කරයි. මනුෂ්‍යයින් සිටින්නේ සම්පූර්ණ අන්ධකාරයේය. පරම පියා පවසන්නේ මෙයත් නාටකයේ නියම වී තිබේ. පරම පියා මෙතැන අසුන් ගෙන ඔය දරුවන්ව අවදි කරයි. නව ලෝකය පැරණි වන්නේ කෙසේද යන මෙම මුලු නාටකය ගැනම ඔබ දැන් දන්නවා. පරම පියා පවසන්නේ දැන් සෑම දෙයක්ම අතහැර එක් පියා පමණක් සිහි කරන්න. අපි කිසි කෙනෙකුට අකමැති නැත. ඔබ මෙය විස්තර කළ යුතුයි. නාටකයට අනුව, මායාගේ රාජධානිය තිබිය යුතුයි. පරම පියා පවසන්නේ සුමිහිරිතම දරුවනි, මෙම චක්‍රය දැන් අවසන් වනවා. ඔබට දැන් පරමාත්ම දෙවියන්ගේ උපදෙස් ලැබෙන අතර, ඔබ ඒවා අනුගමනය කළ යුතුයි. ඔබ තව දුරටත් පාපයන් පහේ උපදෙස් අනුගමනය නොකළ යුතුයි. ඔබ මායාගේ උපදෙස් චක්‍රයෙන් භාගයක්ම අනුගමනය කරමින් සිටි අතර, තමෝප්‍රධාන් වී ඇත. මා දැන් ඔබව සතෝප්‍රධාන් කරවීමට පැමිණ ඇත. මෙය සතෝප්‍රධාන් සහ තමෝප්‍රධාන් වීම ගැන නාටකයකි. එය අපහාස කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. සමහරුන් විමසන්නේ මේ ඒම සහ යෑම පිළිබඳ නාටකය, දෙවියන් නිර්මාණය කළේ ඇයි? 'ඇයි?' පිළිබඳ ප්‍රශ්නය මතු වන්නේ නැත. මෙය නාටක චක්‍රය වන අතර එය නොනවත්වාම නැවත නැවතත් සිදු වෙයි. මෙම නාටකය සදාකාලිකයි. ස්වර්ණමය යුගය ගෙවී ගොස් ඇති අතර එය දැන් කලි යුගයයි. පරම පියා දැන් නැවතත් පැමිණ ඇත. දිගින් දිගටම 'බාබා, බාබා' යැයි පවසන්න, එවිට ඔබට දිගටම යහපතක් සිදුවෙයි. පරම පියා පවසන්නේ මෙම දේවල් ඉතාමත් ගැඹුරු මෙන්ම විනෝදජනකයි. මෙවැනි කියමනකි සිංහදේනුවකගේ කිරි දැමීමට රත්තරං බඳුනක් අවශ්‍යයි. ඔබගේ බුද්ධිය, රත්රන් වන්නේ කෙසේද? බුද්ධිය තිබෙන්නේ ජීවාත්මය තුළයි. ජීවාත්මය පවසන්නේ මගේ බුද්ධිය දැන් යන්නේ බාබා වෙතටයි. මා බොහෝ සෙයින් බාබාව සිහි කරනවා. කොහේ හෝ නිකමට අසුන් ගෙන සිටින විට, බුද්ධිය වෙනත් දිසාවන් වෙත යයි. ඔබගේ බුද්ධිය නිතරම ඔබගේ ව්‍යාපාර ආදිය සිහිකරයි. එවිට ඔබගේ බුද්ධිය ඔබට සවන් නොදෙන්නාක් මෙනි. මෙයට උත්සාහයක් අවශ්‍ය වෙයි. මරණය ලං වත්ම, ඔබ අඛණ්ඩව සිහිපත් කිරීමේ සිටියි. මරණයක් සිදුවන වෙලාවකදී, සෑම කෙනෙක්ම පවසන්නේ දෙවියන් සිහි කරගන්න! පරමාත්ම පියාම දැන් පවසන්නේ මා සිහි කරන්න! එය දැන් ඔබ සියල්ලන්ගේම විශ්‍රාමික අවදියයි. ඔබ ආපසු නිවසට යා යුතුයි, ඔබ මා සිහි කළ යුත්තේ මේ නිසයි. වෙනත් කිසිවකට සවන් නොදෙන්න. ඔබගේ හිස් මත බොහෝ උපත් වල පාප බර තිබේ. ශිව බාබා පවසන්නේ මේ කාලයේදී සෑම කෙනෙක්ම අජාමිල් වැනිය. ප්‍රධානතම දෙය වන්නේ, ඔබ පිවිතුරුභාවයට පත් වන, සිහිපත් කිරීමේ වන්දනා ගමනයි. ඔබ අතරේ බොහෝ සෙනෙහස තිබිය යුතුයි. එකිනෙකාගෙන් ඔවදන් ලබා ගන්න. පරම පියා, සෙනෙහසේ මහා සාගරයයි. එබැවින් ඔබ අතරේ, එකිනෙකා කෙරෙහි බොහෝ සෙනෙහස තිබිය යුතුයි. ජීවාත්ම අවධානයට පත් වී පරමාත්ම පියාව සිහි කරන්න. ඔබ සහෝදර, සහෝදරියන් යන සම්බන්ධතාවයද ඉක්මවා යා යුතුයි. සහෝදරයන් හෝ සහෝදරියන් සමග යෝගාවේ නොසිටින්න. ඒකායන පියා සමග පමණක් යෝගාවේ සිටින්න. පරමාත්ම පියා, ජීවාත්මයන්ට පවසන්නේ මා සිහිපත් කරන්න, එවිට ඔබගේ දූෂිත බැල්ම අවසන් වෙයි. භෞතික ඉන්ද්‍රියන් තුළින් කිසිම පාපකාරී ක්‍රියාවක් සිදු නොකරන්න. ඔබගේ මනසට අනිවාර්යෙන්ම කුණාටු පැමිණෙයි. ගමනාන්තය ඉතා ඉහළයි. බාබා පවසන්නේ ඔබගේ භෞතික ඉන්ද්‍රියන් ඔබව මුලා කරන බව ඔබ දකින විට, බොහෝ ප්‍රවේසම් වන්න. ඔබ යම් වැරැද්දක් සිදු

කළොත්, සියල්ලක්ම අවසන් වෙයි. මෙවැනි කියමනකි ඉහළ නඟින අය, දෙව්ලොව අධිපතියන් වෙයි. ඔබ උත්සාහ නොකර, කිසිම දෙයක් සිදු විය නොහැක. විශාල උත්සාහයක් අවශ්‍යයි. තමන්ගේ සිරුර ඇතුලුව, ඒ හා බැඳී සියලුම ශාරීරික සම්බන්ධතා බිඳ දමන්න. සමහරුන්ට කිසිම බන්ධනයක් නොමැති වුවත්, ඒ තිබියදී ඔවුන් සිර වී සිටියි ඔවුන් පරම පියාගේ ශ්‍රීමත් පිළිපදින්නේ නැත. ඔබට රු 100,000 සිට 200,000 තිබෙනවා විය හැක, එමෙන්ම ඔබ උසස් පවුලකට අයත් වනවා විය හැක, නමුත් බාබා පවසන්නේ ඔබගේ ව්‍යාපාරය තුළ වැඩිපුර සිර නොවන්න. විශ්‍රාමික තත්ත්වයේ සිටින කෙනෙක් බවට පත් වන්න. ඔබගේ වියදම් අඩු කරගන්න. දුප්පතුන් බොහෝ සරළ අන්දමකින් ජීවත් වෙයි. දැන් මතු වී ඇති නව නිපැයුම් දෙස බලන්න. ඒ ගැන අහන්නවත් එපා! ධනවත් අයට වියදම් හැර වෙනත් දෙයක් නැත. නැත්නම්, ඔබගේ බඩට අවශ්‍ය වන්නේ මොනවාද? පිටි රාත්තල් කාලක් පමණයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. එකිනෙකාට බොහෝ සෙනෙහසින් යුතු වන්න, නමුත් සහෝදරයන් හෝ සහෝදරියන් සමග යෝගාව තබා නොගන්න. භෞතික ඉන්ද්‍රියන් තුළින් කිසිම පාපකාරී ක්‍රියාවක් සිදු නොකරන්න.
2. පරමාත්ම දෙවියන්ගේ උපදෙස් අනුගමනය කර, සතෝප්‍රධාන් වන්න. මායාගේ උපදෙස් අත්හරින්න. ඔබගේ සමූහය බොහෝ ශක්තිමත් කර, එකිනෙකාගේ උදව්කරුවන් වන්න.

**වරදානය:** ඔබගේ සුදුසුකම් ඔබගේ අරමුණ සමඟ තුලනය කිරීමේ ක්‍රියාව සිදුකර, ඉහළ නැඟීමේ මනෝ ස්ථිතිය අත්විඳ පියා මෙන් පරිපූර්ණ සහ පරිසමාප්ත වන්න.
ඔය දරුවන්ට අවශ්‍ය වන්නේ ලෝකයට යහපත සැළසීම වන අතර, ඔබට පියාට සමාන වීමේ උසස් අපේක්ෂාවක් ද ඇත. කෙසේවෙතත්, ඔබේ ඉලක්කය සහ එහි සුදුසුකම් අතර ඔබට සහ අන් අයට දෘශ්‍යමාන විය යුතු වෙනසක් ඇත. එබැවින්, ඉහළ නැඟීමේ මනෝ ස්ථිතිය සඳහා මෙම සමබරතාවය තබා ගැනීමේ ක්‍රියාව සිදුකර ඕනෑම වෙනසක් අවසන් කරන්න. ඔබට එම සිතිවිල්ල තිබේ, නමුත් ඔබේ සිතිවිල්ල අධිෂ්ඨානයෙන් පූරවා ගන්න, එවිට ඔබට පියා මෙන් පරිපූර්ණ සහ පරිසමාප්ත වීමට ආශිර්වාදය ලැබෙනු ඇත. දැන් ඉතින්, සිදුවන දෙආකාරයේ භ්‍රමණය මාරු කරන්න: ස්වදර්ශන චක්‍රය ඇත, නමුත් අන් අය දෙස බැලීමේ චක්‍රායුධය ද ඇත. එසේම නාස්තිකාර කරුණු පිළිබඳව ත්‍රිකාලදර්ශී වීම නවත්වා, ඔබ වෙනුවෙන්ම පිරිසිදු හා ධනාත්මක සිතිවිලි ඇති කර, ස්වදර්ශනචක්‍රය පමණක් භ්‍රමණය කරන්න.

**පාඨය:** සේවය කිරීමේ භාග්‍යය ලැබීම උතුම්ම භාග්‍යය වේ.

***** ඕම ශාන්ති *****

**අශාරීරික ස්ථිතියේ පුහුණුව වැඩි කරන්න(අශාරීරී සහ විදේහී).**

ඔබේ ශරීරය සහ ශාරීරික ලෝකය අමතක කර අශාරීරික බවට පත් වී, උත්තරීතර වාසස්ථානයේ වැසියෙකු වන්න. ඉන්පසුව, උත්තරීතර වාසස්ථානයේ වාසය කරන්නෙකුගේ සිට අව්‍යක්ත ස්ථිතියේ ස්ථාවර වන්න. ඉන් අනතුරුව සේවය කිරීමට ශබ්දයට පැමිණෙන්න. සේවය කරන අතරතුර, ඔබේ ස්වරූපය පිළිබඳ අවධානය පවත්වා ගන්න. තත්පරයකටත් අඩු කාලයකින් ඔබට අවශ්‍ය ඕනෑම තැනක ඔබේ බුද්ධිය නිරත කරවන්න, එවිට ඔබ ගෞරවයෙන් සමත් වනවා ඇත.